# කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ පුස්තකාල භාවිතය හා අධ්‍යයන ප්‍රතිඵල අතර සම්බන්ධය
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

පී.සී. විජේසිංහ[1]

**සංක්ෂේපය**

පුස්තකාලය යන්න දැනුම සපිරුණු භාණ්ඩාගාරයක් වශයෙන් නිර්වචනය කල හැකිය. සෑම විශ්වවිද්‍යාල පුස්තකාලයක්ම විද්‍යාර්ථීන්ට දැනුම ලබා දෙන්නා වූත් විශ්වවිද්‍යාල පද්ධතිය තුල හදවත බඳු වූත් ඒකකයකි. එබැවින් පුස්තකාල භාවිතය විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතු සමග බැඳී පවතින්නක් බවට සැකයක් නැත. නමුත් වර්තමානය වන විට තාක්‍ෂණයේ දියුණුවත් සමග තොරතුරු ගවේෂණය සඳහා පුස්තකාල භාවිතය අවම කරමින් ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිතයට විද්‍යාර්ථීන් තුළ නැඹුරුවක් පවතින බවට පර්යේෂණ මඟින් අනාවරණය කර ඇත. මේ නිසා පුස්තකාල භාවිතය අවම වීම විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතුවලට බලපෑමක් ඇති කරයි ද යන්න සොයා බැලීම වැදගත් ය. ඒ අනුව මෙම අධ්‍යයනය මූලික අරමුණවන්නේ පුස්තකාල භාවිතය, විද්‍යාර්ථීන්ගේ ශ්‍රේණි ලකුණු සාමාන්‍ය සඳහා සිදු කරන බලපෑම පිළිබඳව සොයා බැලීමයි. අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියළුම පීඨ නියෝජනය වන පරිදි සසම්භාවි නියැදියක් මඟින් විද්‍යාර්ථීන් 160 තෝරා ගැනුණ අතර ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් දත්ත ලබා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත වලට අමතරව ද්විතීයික දත්ත යොදා ගැනුණි. ප්‍රශ්නාවලිය මඟින් ප්‍රාථමික දත්ත හා සඟරා, වාර ප්‍රකාශන, පොත්පත් මඟින් ද්විතීයික දත්තත් ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේදී හෙලි වූයේ විද්‍යා හා වාණිජ්‍ය පීඨ වල හැර සෙසු පීඨයන් වල විද්‍යාර්ථීන්ගේ පුස්තකාල භාවිතය හා අධ්‍යයන ප්‍රතිඵල අතර ප්‍රමාණවත් ධන සහසම්බන්ධතාවක් නොමැති බව යි. මීට අමතරව විශේෂවේදී විද්‍යාර්ථීන් පුස්තකාලය භාවිත කිරීමට වැඩි නැඹුරුවක් දක්වන බව අනාවරණය විය. පුස්තකාල භාවිතය හා අධ්‍යයන ප්‍රතිඵල අතර ධන සහ සම්බන්ධතාවක් පවතී යන කල්පිතය පිළිගැනීමට හැකි විය.

**මුඛ්‍ය පද ඃ** *පුස්තකාල භාවිතය, විශේෂවේදී විද්‍යාර්ථීන්, අධ්‍යයන ප්‍රතිඵල*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
chathuwijesinghe16@gmail.com